# උපදෙස් පත්‍රිකාව

**<u>අයදුම්කරුවන් සඳහා උපදෙස්</u>**

මෙම පාඨමාලාව සඳහා ලියාපදිංචි වීම මාර්ගත ක්‍රමවේදය ඔස්සේ පමණක් සිදු කරන බැවින් ඒ සඳහා පහත සඳහන් පියවර අනුගමනය කරනු මැනවි.

**පියවර 01**

අයදුම්පත් ගාස්තු ගෙවීම

- ඔබ මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත සම්පූර්ණ කිරීමට ප්‍රථමයෙන් ඩිප්ලෝමා පාඨමාලාවට අදාල ගිණුම් අංකයට අයදුම්පත් ගාස්තු වශයෙන් රුපියල් 2500/= මුදලක් ගෙවීම අනිවාර්ය වේ.(මහජන බැංකුව - ගංගොඩවිල ශාඛාවට බැර වන පරිදි ඕනෑම මහජන බැංකුව ශාඛාවකින් මෙම මුදල් තැන්පත් කිරීම සිදු කළ හැකිය. )

| පාඨමාලාව | ගිණුම් අංකය |
|---|---|
| අපරාධවිද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව **(Intake 13)** | 013010001322 |

- මුදල් තැන්පතු රිසිට් පතේ **පාඨමාලාවට අයදුම්කරන්නාගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා දුරකථන අංකය සඳහන් කිරීම අනිවාර්ය වේ.**
- **බැංකු රිසිට් පතෙහි ඡායාපිටපතක්** ඔබ ළඟ තබා ගැනීම අනිවාර්ය වේ.
- ඔබ විසින් ගෙවන ලද අයදුම්පත් ගාස්තුව කිසිම හේතුවක් මත නැවත නොගෙවන බව ද දන්වා සිටිමු.

පාඨමාලාව සඳහා පාඨමාලා ගාස්තු <u>වාරික 03කින් ගෙවීමට</u> හැකිය. **පළමු වාරිකය පාඨමාලාව ආරම්භයට පෙර ගෙවීම අනිවාර්යවන** අතර **පළමු වාරිකය ගෙවා මාස 03ක් තුළ දෙවන වාරිකය ද, දෙවන වාරිකය ගෙවා මාස 03ක් තුළ තෙවන වාරිකය ද ගෙවීම සිදු කිරීම අනිවාර්ය වේ.**( **<u>පාඨමාලාව සඳහා මුදල් ගෙවීමේදි එක් එක් සිසුන්ට අනන්‍ය වූ ගිණුම් අංක පවතින බැවින් පාඨමාලාවට තේරි පත් වූ පසු අදාළ ගිණුම් අංක දැනුම් දෙනු ලැබේ.</u>**)

**පියවර 02**

ඩිප්ලෝමා පාඨමාලාවට අදාල ගිණුම් අංකයට අයදුම්පත් ගාස්තු ගෙවීමෙන් අනතුරුව පහත **ලින්ක්** එකට පිවිස පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමේ අයදුම් පත්‍රය සම්පූර්ණ කරන්න.

https://docs.google.com/forms/d/e/1FAIpQLScfukXNlhsrP8RMK0R9Pw6FAZmnZZQhPa0NV50MCB6R9x6UtA/viewform?usp=sf_link

Diploma in Criminology

**පියවර 03**

ලබාදී ඇති අයදුම්පත්‍රය අයදුම්කරු විසින් එක්වරක් පමණක් පිරවිය හැකි බැවින් එය ඉතාමත් සැලකිලිමත්ව පිරවීමට වගබලා ගන්න. ඔබගේ **නිවැරදි තොරතුරු පමණක්** ලබා දී ඇති **ගූගල් පෝරමයේ** නිවැරදි ස්ථානයේ නියමිත පරිදි පුරවන්න.

එසේම ඔබගේ පෞද්ගලික ලිපිගොනුව තුළ අඩංගු විය යුතු පහත සඳහන් ලේඛනවල **මුල් පිටපත් වල (Original certificates) පී.ඩී.එෆ් (PDF)** පමණක් උඩුගත **(Upload)** කළ යුතුය.**(පහත ලිපිගොනු උඩුගත කිරීමට ප්‍රථමයෙන් එම පී.ඩී.එෆ් (PDF) ලිපිගොනු ඔබගේ නමින් (Rename) කිරීම සිදුකළ යුතු ය.**

i. ජාතික හැඳුනුම්පත් පිටපත **(මුලකුරු සමඟ නම 01 – M.L.Perera -01)**
ii. අ.පො.ස (සා.පෙළ) හා අ.පො.ස (උ.පෙළ) අධ්‍යාපන සහතික පිටපත් **(මුලකුරු සමඟ නම 02 - M.L.Perera -02)**
iii. වෙනත් අධ්‍යාපන සුදුසුකම් සහතික සහතික පිටපත්
iv. සේවා සහතිකය සහ
v. මුදල් ගෙවන ලද රිසිට් පතෙහි පිටපත

**පියවර 04**

අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමෙන් පසු ඔබගේ විද්‍යුත් තැපැල වෙත අප විසින් එවන ලද ඔබගේ අයදුම්පත්‍රයේ පිටපත භාගත (download) කර ගැනීම කළ යුතුය.

**පියවර 05**

එසේ භාගත කරගත් අයදුම්පත්‍රය ලියාපදිංචි තැපැල හරහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ උඩුගත කරන ලද මුල් සහතිකපත්හි සත්‍ය පිටපත් **(True Copy)** බවට සහතික කරන ලද පිටපත් සමඟ අමුණා පහත ලිපිනයට 2023/05/31 දින හෝ එදිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

පාඨමාලා සමායෝජක,
අපරාධවිද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය,
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
ගංගොඩවිල,
නුගේගොඩ.

සැ.යු. - ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවර **"අපරාධවිද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව *2023/2024*"** ලෙස සඳහන් කළ යුතුය.

Diploma in Criminology

## පොදු උපදෙස්

- මෙම **උපදෙස් මාලාවට අනුකූල නොවන ලෙස එවන අයදුම්පත්‍ර හා 2023/05/31 පසු ලැබෙන අයදුම්පත්‍ර කිසිදු හේතුවක් මත සලකා බලනු නොලැබේ.**
- ඔබගේ අයදුම්පත්‍රය අනුව අදාළ පාඨමාලාවේ සම්මුඛ පරීක්ෂණයට ඔබව තෝරා ගනු ලැබුවහොත් ඒ බව පෞද්ගලිකව දන්වනු ලබන අතර පාඨමාලා ගාස්තු ගෙවිය යුත්තේ ඒ අනුවය.
- පාඨමාලා ගාස්තු තම සේවායෝජකයා මඟින් ගෙවීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් තම අයදුම්පත් තම සේවා යෝජකයා මඟින් එවීම ප්‍රයෝජනවත් විය හැකිය.

*********************************************************************************

Diploma in Criminology